# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.　　ඔබේ අංකය / உமது இல. / Your No.　　දිනය / திகதி / Date 08/04/2020


<u>විද්‍යුත් තැපැල මගිනි</u>

නාලක කලුවැව මහතා,
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
අංක 163, කිරුළපන මාවත
කොළඹ 05

**රූපවාහිනී නාලිකා වල විශේෂ ප්‍රවෘත්ති, රජයේ නිවේදන සහ ප්‍රවෘත්ති විකාශනයන් සඳහා සංඥා භාෂාව භාවිතයට ගැනීම පිළිබඳවයි.**

ශ්‍රී ලංකාව තුළ කෝවිඩ් 19 වෛරස් රෝගය පැතිරීම වැළැක්වීම සඳහා රජය විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන අතරතුර මේ පිළිබඳ විශේෂ ප්‍රවෘත්ති, රජයේ නිවේදන සහ ප්‍රවෘත්ති විකාශනයන් ඔස්සේ ප්‍රචාරය කරනු ලැබේ. මෙම ප්‍රවෘත්ති සහ රජයේ නිවේදන සංඥා භාෂාව මගින් විකාශනය නොවීම නිසා, ශ්‍රී ලංකාව තුළ ජීවත්වන බිහිරි ජන ප්‍රජාව වෙත උක්ත ප්‍රවෘත්ති පිළිබඳ දැනගැනීම ගැටළුවක් පවතින බව අදාල ප්‍රජාව විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම්දී ඇත.

ඉහත තත්වය සළකා විශේෂ ප්‍රවෘත්ති, රජයේ නිවේදන සහ ප්‍රවෘත්ති රූපවාහිනී නාලිකා ඔස්සේ ප්‍රචාරය කිරීමේදී උක්ත ප්‍රවෘත්ති සංඥා භාෂාව මගින්ද සමාන්තරව විකාශනය කරන මෙන් සියළුම රූපවාහිනී නාලිකා වෙත දැනුම්දෙන ලෙස කාරුණිකව දන්වා සිටිමු.

මේ පිළිබඳව ඔබ දෙපාර්තමේන්තුව කඩිනම් මැදිහත්වීමක් සිදු කොට ඒ පිළිබඳව අප දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

සභාපතිනි
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk